මාවතගම ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලට අදාල රු.227,901 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2015 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.120,848 ක් වූ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පෙර ගෙවුම් යටතේ ගිණුම්ගත නොකර වර්ෂයේ වියදමට ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ගබඩා අත්තිකාරම් ලෙස ගබඩා අත්තිකාරම් ගිණුමට හර කල යුතු රු.92,115 ක කර්මාන්ත ද්‍රව්‍ය තොග වටිනාකම සමුච්චිත අරමුදලට බැරකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත තොග වටිනාකම එකී වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගතව තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන් සඳහා ලැබී තිබුණු රු.3,000,000 ක ප්‍රාග්ධන ආධාර පුනරාවර්තන ආදායම් යටතේ ද අදාල වියදම ප්‍රාග්ධන වියදම් යටතේ ද ගිණුම්ගත කර තිබුණි.

(ඉ) පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ රු.3,000,000 ක් වූ ගිලන් රථයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබූ අතර නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන ද නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාල දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රුර.3,482,517 ක්ව තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 08 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු. 7,304,776 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.39,784,269 ක් විය. මින් දළ වශයෙන් 11% ක් ලෙස රු.4,348,006 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

(ආ) වර්ෂ ගණනාවකට පෙර සභාවේ සුභ සාධක සංගමයට ගෙවූ රු.25,000 ක් උපයෝගී සේවා යටතේ දක්වා තිබුණි.

(ඇ) ණයගැති ශේෂය තුල දිගු කාලයක සිට පැවත එන කොන්ක්‍රීට් ව්‍යාපෘතියේ ශේෂය වූ රු.343,516 ක් හා බස් නැවතුම්පල ගාස්තු රු.54,940 ක් ඇතුලත්ව තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.17,162,369 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.2,865,594 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,336,192 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.6,201,786 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.16,338,569 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.19,449,701 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.245,538 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.71,256,302 කින් දළ වශයෙන් 86% ක් ලෙස රු.61,619,335 ක් සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.16,338,569 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.68,390,708 න් දළ වශයෙන් 66% ක් ලෙස රු.45,447,891 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් 80% ක් ලෙස රු.36,586,598 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. ප්‍රාග්ධන වියදම වූ රු.19,449,701 න් දළ වශයෙන් 29% ක් ලෙස රු.5,673,419 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබූ අතර ඉතිරි 71% ක් වූ රු.13,776,282 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.3,828,086 ක් වූ අතර වාර්ෂික බිල් කිරීම රු.1,576,221 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට රජයේ ආයතනවලින් රු.218,110 ක වරිපනම් බදු අය වීමට තිබුණි.

2.3.2 බදු කුලී

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු කුලී ශේෂය රු.1,038,498 ක් වූ අතර එතුල 2007 වර්ෂයේ සිට පැවත එන රු.425,090 ක හිඟ ශේෂයක් පැවති අතර එකී ශේෂය සම්බන්ධව තොරතුරු සොයා අදාල අය කිරීම් සිදු කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.504,520 ක්ද මුද්දර ගාස්තු ප්‍රමාණය රු.8,500,000 ක්ද විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් 2013 හා 2014 වර්ෂවලට අදාල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂනය කල යුතු රු.627,880 ක බදු මුදල සමාලෝචිත වර්ෂය අවාසානය තෙක්ම ප්‍රේෂනය කර නොතිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට යැවිය යුතු දායක මුදල් සභාව විසින් නොගෙවීම හේතුවෙන් 2014 වර්ෂය තුල එකී අරමුදල්වලට අධිභාර ලෙස රු.163,452 ක් ගෙවා තිබුණි.

(ඇ) අංක 4215263, අංක 4215466 හා අංක 5506 දරන බැංකු ජංගම ගිණුම් වර්ෂ ගණනාවක සිට අක්‍රියව පැවති අතර එකී ගිණුම්වල පිළිවෙලින් රු. 12,687 ක රු. 4,014 ක හා රු. 93,448 ක ශේෂයන් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියට අදාලව රු.17,292 ක්ද ජල ව්‍යාපෘතියට අදාලව රු.264,779 කද, සේවය හැරගිය අයට අදාලව රු.35,350 කද හිඟ ණය ශේෂ පැවතුණි.

04 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය